


# කැරම් පෝක්

පත්තරේ ජගිරි මහත්තයා නේද ඉස්සරහටම එන්නෙ..? දැන් ඉතින් අහන ඒවට උත්තර බැඳලා නිදහසක් නැති වෙයි.. ඒත් කමක් නෑ. මොන මොන කොන්ත්‍රාත් පටලයිද කියලයි බය..කොහොම උනත් මතක් කරලා පෙස්සමට අස්සන් කරගන්න ඕනෙ..

ආ.. පන්දුක.. කොහෙද මේ ඉන්දියන් ටී ෂර්ට් එකකුත් ඇඳගෙන හයියෙන් හයියෙන් යන්නෙ..? කොන්දත් දෑ කැත්ත වගේ නවාගෙන.. කව්රු හරි පිටට තඩි බෑව ද?

මේකනෙ ජගිරි මහත්තයා තහනම් වචනෙ ක්‍රිකට් කිව්වත් කොහෙන් හරි කැරකිලා එතෙන්ටමයි එන්නෙ.. මං මේ ඉන්දියන් ටී ෂර්ට් එක ඇඳගත්තෙ මෙහේ ඔසියන්ට ඉන්දියන් ශ්‍රී ලංකන් වෙනස අඳුනාගන්න බැරි නිසයි... ඉන්දියානුවෝ ඔසියන්ට තරු පේන්න ගහලා කොමන්වෙල්ත් කප් එකත් ඉස්සුවනේ.. මාත් ඉතින් ඉන්දියන් ටී ෂර්ට් එකක් දාගෙන බොරු ෂෝ පාරක් දැම්මා.. ඒත් ඔසියන්ට නම් ගාණක් වත් නෑ වගේ.. උන් ෆුට් ගැන විතරමයි මේ දවස් වල ටෝක්ස් දාන්නේ..

ඉතින් ඔය කොන්දට මොකද වුණේ..?

ජගිරි මහත්තයා කොහෙන් හරි කැරකිලා කිරිකට් වලටමයි එන්නෙ..

ඒ කිව්වෙ..?

ඒ කිව්වෙ මහත්තයෝ සිරිලංකා ටීම් එක ඔස්ට්‍රේලියාවෙ ඉන්නකම් මම ඔලුව පාත් කරගෙන පපර බෑන්ඩ් එකට මුවා වෙලා වාඩි ගෙන මැච් බැලුවේ.. මොකද හැමදාම අම්බානක පරදින නිසා.. එදා එකපාරටම එම් සී ජී එකේ අන්තිම මැච් එකෙන් අන්තිම මොහොතෙදි අපි දිනුවනේ.. මම එක පාරටම ඔලුව කෙළින් කරලා කොන්දත් කෙලින් කරන් කොඩියත් අරන් හුරේ කියල උඩ පැනපු පාරට කොන්දට මොකක්ද උනා උනාමයි තාම කෙළින් කර ගන්න බැරි වුණා.. දොස්තර මහත්තයත් කිව්වා මාසයක් විතර කොන්ද නවාගෙන ඉඳලා එක පාරටම කෙළින් කළ නිසාලු එහෙම වුණේ කියලා..

ඒක නෙවෙයි පංදුක.. අපේ සිරිලංකා පිල මේ දවස් වල බටහිර ඉන්දියා කොදෙව් දූපත් වලට ගිහිල්ල නේද.ඩ?

අනේ අම්මපා ජගිරි මහත්තයත් කැරකිලා එන්නෙම තහනම් වචනෙ කිරිකට් වලටමනේ.. ඔව් ඔව්. මේ දවස් වල එහේ තමයි ඉන්නෙ.. වැරදිලාද කොහෙද තරුණ කොල්ලො කීප දෙනෙක්වත් අරන් ගිහිල්ලා.. වර්ණපුර කොල්ලයි හේරත් කොල්ලයි ගිය ගමන්ම වැඩ පෙන්නලා.. ජයසූරිය ළමයව දාලා ගියා කියලා පොඩි වලියකුත් යනවලු.. ජයසූරිය ළමයට ඉන්දියාවෙන් සල්ලි මල්ලක් ලැබුණ එකට ඉරිසියාවෙ දාලා ගියා කියලා පත්තර වල පොඩි කසු කුසුවකුත් යනවා.. අනේ මන්දන්නෑ ඕවා.. ඒ ළමයා හොඳයි පිටියේ හතර වටේට නෙලන කාලේ.. මගේ කොන්දට මොනාවත් නෑ.ඩ හැබැයි ඉතින් පහුගිය මැච් 20 කටම පනහේ ඒවා එකම එකයිනෙ ගැහුවෙ.. මට බය ජගිරි මහත්තයා ඔහොම ගියොත් ඉස්සර පෙන්නාපු වැඩත් අපේ කට්ටියට අමතක වෙයිද කියලයි..

එහෙම කියන්න එපා පංදුක.. ජයසූරිය ළමයා කියන්නෙ ජාතික වස්තුවක්.. ඔස්ට්‍රේලියාවට ආව කන්ඩායමෙන් ටිකක් හරි දුවලා පැනලා බෝලෙ ඇල්ලුවේ ඒ ළමයා විතරයි..

ජගිරි මහත්තයා පත්තර වලටම ලියලා ඇස් පෙනීමත් දුර්වලයි වගේ..

මොකක්ද මොකක්ද ඒ කිව්වේ..?

නෑ මං කිව්වේ ඇස්දෙකපා ඇත්තයි ජගිරි මහත්තයගෙ කතාව.. ඒක නෙවෙයි ජගිරි මහත්තයෝ.ඩ අපේ කොල්ලො කැරම් ලෝක ශූරතාව දිනා ගත්තා කියලා දන්නවද..?

මොකද මම නොදන්නෙ.. මොනම ක්‍රීඩාවකින් හරි ලෝක ශූරතාවක් දිනා ගන්නවා කියන්නෙ ලේසි පාසු වැඩක් ද? අපේ කැරම් කන්ඩායමට හිස නමා ආචාරය හා උපහාරය පුද කරන්නම ඕනෙ.

දැන් මුලු ලංකාවෙම කැරම් ප්‍රබෝධයක් ඇති වෙලා. හැම තැනම කැරම් ටූනමන්ට් ඕගනයිස් පාරවල් යනවලු.. එක එක ජාති කැරම් බෝඩ් කඩ වල පිරිලලු .. මළගෙවල් වලට මල් ශාලාවෙන්ම ඇවිත් කැරම් බෝඩ් හයි කරලා දීලා යනවලු.. පන්සල් පල්ලි ඉස්කෝල හැම තැනම කැරම් තරග නැගලා යනවලු.. ක්‍රිකට් ලෝක ශූරතාව දින්නට පස්සෙ අපේ ක්‍රිකට් බැහැලා ගියා ට කැරම් වලට නම් එහෙම වෙන්න දෙන්න හොඳ නෑ.. අපි මේ ගැන යම් වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කල යුතුයි ජගිරි මහත්තයා.. මෙන්න මේකට අස්සමක් දාන්නකො ජගිරි මහත්තයා..

මොන මරාලයක් ද දන්නෙ නෑ.. පෑනක් එක්කම දෙන්නකො බලන්න..

මේකයි ජගිරි මහත්තයා. කැරම් කියන්නෙ අපේ ලේ වල තියෙන ක්‍රීඩාවක්.. අපි ඒක රැකගන්න ඕනෙ..

අපේ ලේවල තියෙන ක්‍රීඩාවක් වෙන්නෙ කොහොමද.ඩ? කැරම් කියන්නෙ ඉන්දියාවෙන් ආව ක්‍රීඩාවක්.. කැරම් විතරක් නෙවෙයි.. හැම ක්‍රීඩාවක්ම රැක ගන්න ඕනෙ.

නෑ මං කිව්වෙ අපේ සමාජයේ හැම තැනම මේ ක්‍රීඩාව කෙරෙනවනේ.. ඒකයි මං කිව්වෙ මේ ක්‍රීඩාව අපේ ලේ වලම තියෙනවා කියලා..

ඒ කිව්වෙ පංදුක..?

වලට දාන එක කැරම් ක්‍රීඩාවෙන් කරන්නෙ දෙපැත්තට බෙදිලා පස්සෙන් හරි ඉස්සරහින් හරි ගහලා වලට දාන එකනේ.. වැඩියෙන්ම ගහලා වලට දාපු අය තමයි දිනන්නෙ.. වලට වැටෙනකල්ම ගහන්නත් පුලුවන්.. කට්ටියක් එක ජාතියක් වලට දානවා.. අනිත් කට්ටි අනිත් ජාතිය වලට දානවා.. ඉතින් මේ වගේ වටිනා ක්‍රීඩාවක් රැකගන්න වැඩ පිළිවෙලක් හැටියට කැරම් අපේ ජාතික ක්‍රීඩාව හැටියට නම් කරන්නයි කියලා පෙස්සමකට අස්සන් ගහගන්න යන අතරවාරේ තමයි ජගිරි මහත්තයා මුණ ගැහුනේ.. අස්සන් 50000 ක් වත් එකතු කරලා ජනාදිපති තුමාට මේක යවන්න ඕනේ.. මං යන්නම් මහත්තයා... ආයේ හමුවෙමුකෝ..

පංදුක බිලිංකම

